පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ගිණුම්කරණය

සතිය- 7

ශ්‍රේණිය-12

සකස් කළේ- ශාන්ත ධර්ම ශ්‍රී විතාරණ,ර/ෆර්ගසන් උසස් විදුහල.

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## හාණ්ඩ හවුල් ව්‍යාපාරවලට අදාළ නීතිමය විධිවිධාන

**(1.) 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත**

**24 වගන්තිය**

ලිඛිත ගිවිසුමක් නොමැති විටදී හා ගිවිසුමේ පවතින කොන්දේසි ප්‍රමාණවත් නොවන විටදී මෙය අනුගමනය කළ යුතුය.

**24 වගන්තියේ ඇතුළත් විධිවිධාන**

1.සෑම හවුල්කරුවෙකුටම ප්‍රාග්ධනයට සමානව දායකවීමට අයිතියක් ඇත.
2.ප්‍රාග්ධනයට කෙසේ දායක වී තිබුණද ලාභාලාභ සම සමව බෙදා ගත යුතුය.
3.ප්‍රාග්ධනයට පොලී ගෙවිය නොහැකිය.
4.පාලන කටයුතුවලට සියලු හවුල්කරුවන් දායක විය යුතු අතර ,හවුල් වේතන ගෙවිය නොහැකිය.
5.ප්‍රාග්ධනයට අමතරව සපයා ඇති ණය සඳහා 5%ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුය.
6.ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පුද්ගලිකව ගෙවූ වියදම් ආපසු ඔවුන්ට ගෙවිය යුතුය.
සටහන- ගැනිලි පිළිබඳ විධිවිධාන නැත.

1.) 1890 හවුල් ව්‍යාපාර ආඥා පණතේ ගිණුම්කරණය හා සම්බන්ධව වැදගත්වන වගන්ති දෙකක අංක සඳහන් කර එම වගන්තිවල ඇතුළත් ගිණුම්කරණයට වඩාත් වැදගත් කරුණු 4ක් දක්වන්න.
2.) ලාල් හා ජයලාල් පවත්වා ගෙන යන හවුල් ව්‍යාපාරයේ ලිඛිත හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුළත් වේ.

1.එකිනෙක හවුල්කරුගේ ප්‍රාග්ධන ශේෂයන් සඳහා 10%ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුය.
2.එක් එක් හවුල්කරු සඳහා රු.1000ක මාසික වැටුපක් හිමිවේ.
3.හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ 2:1 අනුපාතයට බෙදා ගත යුතු ය.
4.හවුල්කරුවන් සිදු කරන ගැනිලි සඳහා 8%ක වාර්ෂික පොලියක් අය කළ යුතුය.
5.හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව සපයා ඇති ණය සඳහා 6%ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුය.
අවශ්‍ය වන්නේ,
ඉහත කොන්දේසි සම්බන්ධයෙන් 1890 හවුල් ව්‍යාපාර ආඥා පණතේ 24වන වගන්තියේ ඇතුළත් විධිවිධාන මොනවාද?